00067

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන

4 වන මට්ටම- අවසාන පරීක්ෂණය - 2010

ESD2235 – පෞරුෂ මනෝ විද්‍යාව

කාලය - පැය 03 යි.

---

දිනය - 2010.06.06 වේලාව - ප.ව. 01.30 ප.ව.04.30

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලට සහ දෙවන කොටසින් තෝරාගත් ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

I - කොටස

01. (i) නිර්වචන දෙකක් ආශ්‍රයෙන් 'පෞරුෂය' නැමති යෙදුම පැහැදිලි කරන්න.

(ii) පෞරුෂය පිළිබඳ පර්යාලෝකනයන් විස්තර කරන න්‍යායාත්මක ප්‍රවර්ගයන් දෙක නම් කරන්න.

02. (i) 'පෞරුෂ අක්‍රමතා' යන්න කෙටියෙන් විස්තර කරන්න.

(ii) සම්ප්‍රජන්‍ය ස්ව පීඩකත්වය (DSH) ඇති පුද්ගලයෙකු තුළ දැකිය හැකි ගුණාංග 3 ක් දක්වන්න.

03. (i) පෞරුෂය පිළිබඳව ඇති පර්යාලෝකයන් 4 ලැයිස්තු ගත කරන්න.

(ii) 'ස්ව ස්කිමා' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

04. (i) පෙර පාසල් ගුරුවරුන් සඳහා පෞරුෂ තක්සේරුකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.

(ii) ප්‍රාථමික පාසල් ළමුන්ගේ පෞරුෂය තක්සේරු කිරීම සඳහා ඔබට භාවිතා කළ හැකි පෞරුෂ තක්සේරුකරණ ශිල්ප ක්‍රම 2 ක් නම් කරන්න.

05. (i) අන්තර්වර්තිත පෞරුෂ වර්ගය සහ බහිර්වර්තික පෞරුෂ වර්ගය විස්තර කරන ලද මනෝවිද්‍යාඥයා නම් කරන්න.

(ii) අන්තර්වර්තිත හා බහිර්වර්තිත පෞරුෂ වර්ග අතර ඇති වෙනස්කම් 2 ක් සසඳන්න.

06. කාල් රොජර්ස්ගේ පෞරුෂය පිළිබඳ න්‍යායට අනුව පුද්ගලයා සකස් වී ඇති පැති තුන කෙටියෙන් පැහැදිලි කරන්න.

07. (i) සිමාස්ථ පෞරුෂ අක්‍රමතා යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(II). සිමාස්ථ පෞරුෂ අක්‍රමතා සහිත ළමුන් තුළ නිරීක්ෂණය කළහැකි ගුණාංග 3 ක් දක්වන්න.

08. බාලවියේ ළමුන් තුළ ඇති සිතිවිලි සහ හැඟීම් නිර්මාණශීලි ලෙස ප්‍රකාශ කිරීම සඳහා සැලසුම් කළහැකි ක්‍රියාකාරකම් 5 ක් දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

<u>II - කොටස</u>

09. I. සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් විසින් ඉදිරිපත් කරන ලද පෞරුෂය පිළිබඳ මනෝ විශ්ලේෂණ න්‍යායයෙහි අන්තර්ගත ප්‍රධාන අංශ 3 දක්වන්න.

(ලකුණු 05)

II. උක්ත දක්වන ලද අංශ තුනෙහි අන්තර් ක්‍රියාකාරීත්වය පුද්ගලයෙකුගේ පෞරුෂ සංවර්ධනයෙහි ලා දායක වන අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 15)

10. I. සමාජ ඉගෙනුම් න්‍යාය ළමුන්ගේ පෞරුෂ සංවර්ධනය පිළිබඳ පැහැදිලි කරන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

II. සමාජ ඉගෙනුම්වාදයට අනුව ළමුන්ගේ පෞරුෂ සංවර්ධනය සම්බන්ධයෙන් විද්‍යුත් මාධ්‍යය සිදු කරන බලපෑම විශ්ලේෂණය කරන්න.

(ලකුණු 12)

11. කෙනෙකුගේ පෞරුෂ සංවර්ධනය සඳහා ආරමය සාධක සහ පාරිසරික සාධක සමානව බලපෑම් එල්ල කරයි.

මෙම කියමන සනාථ කරන්න.

(ලකුණු 20)

12. I. විනාශකාරී හෝ ප්‍රචණ්ඩකාරී සිදුවීමක් හේතුකොටගෙන පුද්ගලයෙකුට ඇතිවිය හැකි කාංසා අක්‍රමතාවය නම් කරන්න.

(ලකුණු 03)

II. උක්ත සඳහන් කරන ලද අක්‍රමතාවය සහිත සිසුන් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ දක්වන්න.

(ලකුණු 07)

III. විනාශකාරී සිදුවීමක් අත්දකින ලද ළමයෙකුට ඇති විය හැකි දීර්ඝ කාලීන ප්‍රතිවිපාක අවම කිරීම සඳහා යොදා ගත හැකි පියවර 5 ක් විස්තර කරන්න.

(ලකුණු 10)

13. I. ප්‍රාථමික වයසේ ළමුන්ගේ පෞරුෂය තක්සේරු කිරීම සඳහා චර්යා තක්සේරුකරණ ක්‍රම ශිල්පය ඔබ භාවිතා කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

II. චර්යා තක්සේරුකරණ ක්‍රියාවලියේ දත්ත වාර්තා තබා ගන්නා ක්‍රම 2 ක් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

14. පහත දැක්වෙන ඕනෑම මාතෘකා 2 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ප්‍රක්ෂේපිත පෞරුෂ පරීක්ෂණ
2. විශාදය
3. ඕල්පෝට්ගේ ගති ලක්ෂණ න්‍යාය
4. පුද්ගලික වෙනස්කම් පිළිබඳ කාල් රොජස්ගේ මතවාදය

(ලකුණු 10 x 2 = 20 )

\- හිමිකම් ඇවිරිණි -

0(

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 4**

**FINAL EXAMINATION – 2010**

**ESD 2235 – PERSONALITY PSYCHOLOGY**

**DURATION : THREE (03) HOURS**

06.06.2010

**DATE: ~~13th December 2008~~** **TIME : 01.30 p.m.-04.30 p.m.**

**Answer all questions in Part I and any three of Part II.**

## PART - I

01. i. Explain the term 'personality' with the help of two (02) available definitions.
    ii. Name the two categories of theories which describe the perspectives of personality.

02. i. Briefly describe 'personality disorders'.
    ii. Mention three (03) characteristics of a person with Deliberate Self-Harm(DSH)

03. i. List out 4 different perspectives on personality.
    ii. Briefly explain "self-schema"

04. i. Explain the importance of personality assessment for pre-school teachers.
    ii. Name two (02) personality assessment techniques that you can use to assess the personality of primary school children.

05. i. Name the psychologist who described Introverted Personality Type and Extraverted Personality Type.
    ii. Compare 2 differences between Introverted and Extraverted Personality Types.

06. Briefly explain the 3 profiles that individuals are forming according to Carl Rogger's theory of personality.

07. i. What do you mean by Borderline Personality Disorder (BPD)?
    ii. Indicate 3 characteristics of BPD you can observe in children.

08. Indicate 5 activities that could be organized for creative expressions of thoughts and feelings in young children.

(5 x 8 = 40)

## PART - II

09. i. Mention the three (03) aspects of psycho analytic theory of personality as explain by Freud.

(05 marks)

ii. Briefly explain, how the interaction of above aspects contribute to the personality development of a person.

(15 marks)

10. i. Discuss the personality development of children as explain by Social Learning Theory

(08 marks)

ii. Analyse the influence of electronic media on personality development in young children according to Social Learning Theory.

(12 marks)

11. The genetic factors and environment factors equally influence on one's personality development.
Justify this statement.

(20 marks)

12. i. Name the anxiety disorder that can be resulted a person due to traumatic or violent incident.

(03 marks)

ii. Indicate the main characteristics of the above disorder you can observe in children.

(07 marks)

iii. Describe 5 steps to minimize long term effects that children can be experienced by a traumatic incident.

(10 marks)

13. i. Explain how would you use behavioural assessment techniques to assess the personality in primary grade children.

(10 marks)

ii. Explain 2 data reporting methods in behavioural assessment process.

(10 marks)

14. Write short notes on any two of the following.
   i. Projective Personality Test.
   ii. Depression
   iii. All port's Trait Theory.
   iv. Carl Rojers's view on Individual Differences.